# තරුණ අයිතිවාසිකම්, පුරවැසි ක්‍රියාකාරිත්වය හා දේශපාලන සහභාගීත්වය.

*තරුණයා වැඩලෝකයට සංක්‍රමණය*
*වීමේදී බලපාන තිරසර ප්‍රතිපත්ති ප්‍රචලිත කිරිම.*


UNITED NATIONS ESCAP
Economic and Social Commission for Asia and the Pacific

N Y S C

FSHS

Foundation for
Strengthening
Human Skill

## පෙරවදන

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආසියානු හා පැසිපික් කලාපීය ආර්ථික හා සමාජීය කොමිසම විසින් කලාපීය රාජ්‍ය වල පාසල් ශිෂ්‍ය හා තරුණ ප්‍රජාව වැඩලොවට සංක්‍රමණය වීමේදී ඊට බලපානු ලබන ප්‍රතිපත්තීන් හඳුනාගැනීම හා බලගැන්වීම සඳහා තාක්ෂණික හා මූල්‍ය පහසුකම් සපයයි. මෙහිදී ප්‍රධාන වශයෙන් පහත අංශ කෙරෙහි අවධානය යොමු කෙරේ.

1. සියළු පාර්ශවයන් සඳහා ප්‍රතිලාභ ලැබෙන ප්‍රතිපත්තීන් පිළිබඳ තරුණ ප්‍රජාව සවිබලගැන්වීම,
2. ප්‍රතිපත්ති සම්පාදකයින් දැනුවත් කිරීම/සවිබලගැන්වීම,
3. තිරසර ප්‍රතිපත්ති සියළු පාර්ශවයන් සමග බෙදාහදා ගැනීම,
4. විවිධ පාර්ශවකරුවන් අතර සහසම්බන්ධතාවය ප්‍රවර්ධනය කිරීම,
5. පුහුණුව මගින් වැඩකිරීමේ ධාරිතාවය වර්ධනය කිරීම,

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, තරුණයා හා පාසල් ශිෂ්‍යයා වැඩලොවට සංක්‍රමණය වීමේදී බලපාන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන රාජ්‍ය හා පෞද්ගලික ආයතන , වෘත්තීය පුහුණුව හා වැඩලොව අභිමුඛ අභිප්‍රේරණ වැඩසටහන් ක්‍රියාත්මක කරන ආයතන එක්ව මෙම විද්‍යුත් පහසුකාරක උපාංග පරිශීලනය කර නව ප්‍රතිපත්ති සම්පාදනය කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

ජාතික තරුණ සේවා සභාව විසින් බාහිර පාර්ශවයන්ගේ සහයෝගය,තාක්ෂණික මඟපෙන්වීම හා උපායමාර්ගික ක්‍රමවේදයන් භාවිත කරමින් මෙම ප්‍රතිපත්ති ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරනු ලබන අතර මේ සඳහා අදාළ විෂයන් පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර අත්දැකීම් ඇති මානව සම්පත් ඵලදායිතාකරණ පදනම හරහා ධාරිතා සංවර්ධන පුහුණු හා අධ්‍යයන මෙවලම් ඉදිරිපත් කරනු ලබයි.

මේ අනුව පුළුල් ආයතනික මැදිහත්වීමක් හා ජාත්‍යන්තර ප්‍රතිපත්තීන් පිළිබඳ රාජ්‍යයන් අතර දැනුම හා අත්දැකීම් හුවමාරු කරගැනීමට මෙම විද්‍යුත් මෙවලම් හා පහසුකම් භාවිත කෙරෙනු ඇත. මින් ඉදිරිපත් කරනු ලබන පුහුණු මොඩියුල ශ්‍රී ලංකාවේ හා කලාපීය රාජ්‍යවල පුහුණු හා රැකියා උත්පාදනයේදී තරුණ ප්‍රජාව තුල පෞරුෂ ගුණාංග සංවර්ධනය සඳහා ඉවහල් කරගැනීමට අපේක්ෂා කෙරේ.

## කතුවැකිය :

මෙම පුහුණු මොඩියුලය මගින්, පාසලින් වැඩලොවට සංක්‍රමණය වීමේදී ශිෂ්‍ය හා තරුණ ප්‍රජාව ළඟාකර ගත යුතු කුසලතාවයන් ළඟාකර ගැනීම සඳහා තාක්ෂණික මඟපෙන්වීම් ලබා දෙනු ලැබේ. තරුණ ප්‍රජාව සම්බන්ධව ඍජුවම කටයුතු කරනු ලබන ප්‍රතිපත්ති සම්පාදකයින්, ගුරුවරුන්, වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ නිරතවන්නන්, පුහුණු පහසුකම් සපයන්නන් හා තරුණ ප්‍රජාවට ස්වයං අධ්‍යනයන් මගින් තම සේවා ධාරිතාවය වර්ධනය කිරීම පිණිස සකස් කර ඇත.

මෙම පුහුණු මොඩියුලය ක්‍රියාත්මක කිරිමේදී එහි පුහුණු කාලවකවානු පිළිබඳ තීරණය කිරිම ප්‍රධාන පහසුකම් සපයන්නා විසින් තීරණය කල යුතුය. ඉලක්ක පිරිසේ අවශ්‍යතාවය මත පුහුණු කාලසීමාවන් තීරණය කල යුතු අතර එය එක් දින පුහුණු වැඩසටහනක් හෝ දින දෙකහමාරක පුහුණුවක් ලෙස ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි විෂයපථය පෙළගස්වා තිබේ. පුහුණුවෙන් අනතුරුව නැවුම්කරණ එක් දින සාකච්ඡාවක් පුහුණුවන්නන්ට ලබා දීමට අවැසි පරිදි විෂය කරුණු භාවිත කල යුතුය.

තරුණ අයිතිවාසිකම්, පුරවැසි ක්‍රියාකාරීක්වය හා දේශපාලන සහභාගීත්වය තරුණයින්ගේ මූලික අයිතියකි. ඒ පිළිබඳව අධ්‍යනය කිරිම හා දැණුවත්භාවය වර්ධනය කිරීම ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ වගකීමක් වන අතර තරුණ කේන්ද්‍රිය සංවර්ධන වැඩපිළිවෙලක් හඳුන්වා දීම සඳහා මෙය බෙහෙවින් උපකාරි වනු ඇත. තරුණයාගේ මූලික අයිතීන් ආරක්ෂාවන තරුණ සංවර්ධන ප්‍රවේශයක් හඳුන්වාදීමට මෙම පුහුණු අත්පොත උත්සහ කරනු ලබන අතර ඒ සඳහා තාක්ෂණික හා න්‍යායාත්මක මඟපෙන්වීම මෙමඟින් ලබාදෙනු ලැබේ.

ඒ අනුව මනාලෙස සැලසුම් කල සැසි සැලැස්ම හා උපකාරක භාවිත කරමින් ඉහළ මට්ටමේ පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය පියවර ගත යුතුය. මීට අමතරව සහය පුහුණුකරුවෙකුගේ සේවය ලබා ගැනීමට ද අපි නිර්දේශ කරමු. එමඟින් ඔබට මඟහැරීමට ඉඩ ඇති කරුණු පිළිබඳ අවධානය යොමුකිරීමට ද මහඟු අවස්ථාවක් ලැබෙනු ඇත.

## තරුණ අයිතිවාසිකම්,පුරවැසි ක්‍රියාකාරීත්වය හා දේශපාලන සහභාගීත්වය.

**<u>පුහුණු අත්පොත</u>**


| පටුන | පිටු අංකය |
| --- | --- |
| 1.පුහුණු අත්පොත පිළිබඳ හැඳින්වීම | 05 |
| 2.පුහුණු මොඩියුලයේ අරමුණු | 05 |
| 3.පුහුණු මොඩියුලයේ අන්තර්ගතය | 05-06 |
| 4.තරුණ අයිතිවාසිකම් | 06 |
| 5.කම්කරු අයිතිවාසිකම් | 07 |
| 6.තරුණයන් වෙත පැවරෙන වගකීම් | 07 |
| 7.පුරවැසි සහභාගීත්වය | 08 |
| 8.පාලනයට තරුණ ප්‍රජාව සහභාගී කර ගැනීමේදී මතුවන අභියෝග | 08-09 |
| 9.සැසි සැලැස්ම | 10 |

## 1 කොටස -

### පුහුණු අත්පොත පිළිබඳ හැඳින්වීම.

වර්තමාන තරුණ ප්‍රජාව සිවිල් ක්‍රියාකාරකම් හා දේශපාලන ක්‍රියාකාරකම්වලින් ඈත්වෙමින් පවතී.මේ සඳහා සෘජුවම බලපානු ලබන්නේ තරුණයා කේන්ද්‍රගත තීන්දු තීරණ ගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපිත නොවීම හා තරුණ අවශ්‍යතාවයන්, ගැටලු හෝ ඔවුන්ගේ සංවර්ධනය කෙරෙහි බලපාන ක්ෂේත්‍රයන් ආමන්ත්‍රණය නොවීමයි. පාසලින් වැඩලොවට සංක්‍රමණය වීමට පෙර සිවිල් සමාජය සමඟ කටයුතු කිරීමට තරුණ පිරිස් හුරුවිය යුතු අතර ඒ සඳහා පෙර දැණුමක් හෝ අවබෝධයක් තිබිය යුතුය.

තරුණයාගේ යුතුකම් ඔහුගේ වගකීම් හා සිවිල් සමාජ භූමිකාව පිළිබඳ දැණුවත්භාවය වර්ධනය කර දේශපාලන වශයෙන් තීන්දු තිරණ ගැනිමේ ක්‍රියාවලියට ඔවුන්ව සම්බන්ධ කිරීම සඳහා තාක්ෂණික හා න්‍යායාත්මක දැණුම මෙම පුහුණු අත්පොතින් ලබා දීමට උත්සහ කරනු ලැබේ.

සිවිල් සමාජ ක්‍රියාකාරකම් වලදී තරුණ සහභාගිත්වය වර්ධනය කල යුතු අතර ඔවුන්ගේ අයිතීන් පිළිබඳව සිවිල් සමාජයද දැණුවත් විය යුතුය. විශේෂයෙන් ප්‍රතිපත්ති සම්පාදකයින් මේ පිළිබඳව අවධානය යොමු කල යුතු අතර තරුණයාගේ සංවර්ධනය උදෙසා නව ප්‍රතිපත්ති සම්පාදනය කිරිම, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරිම හා නියාමන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරිම හා එමගින් තරුණ ප්‍රජාවේ සංවර්ධනය තහවුරු කිරීම සඳහා ප්‍රවේශයන් හඳුන්වාදීමට අවශ්‍යය.

ශ්‍රී ලංකාව සිවිල් අරගල දෙකකට හා වසර 30ක ජනවාර්ගික යුද්ධයකට මුහුණ දුන් රටකි. ඒ සඳහා සෘජුවම තරුණයා සම්බන්ධ වු අතර අනාගතයේ එවැනි තත්වයන් ඇති නොවිම සඳහා තරුණ හා සිවිල් සමාජ ඒකාබද්ධ නව සංවර්ධන ප්‍රවේශයක් ඇති කර තීන්දු තීරණ ගැනිමේ ක්‍රියාවලියට සම්බන්ධ කිරීම උදෙසා මෙම පුහුණු අත්පොත සකස් කරනු ලබයි.

## 11 කොටස -

### පුහුණු මොඩියුලයේ අරමුණු,

තරුණයාගේ මූලික අයිතිවාසිකම්, සිවිල් සමාජ ක්‍රියාකාරකම් හා දේශපාලන සහභාගිත්ව ප්‍රවර්ධනය උදෙසා තාක්ෂණික හා න්‍යායාත්මක ප්‍රවේශයන් මෙම පුහුණු අත්පොතින් ලබා දීම හා ඒ සඳහා විධිමත් පුහුණු වැඩසටහනක් සංවිධානය කිරීමට අවශ්‍ය මඟපෙන්වීම ලබා දීම මෙම පුහුණු අත්පොත ඉදිරිපත් කිරීමේ අරමුණයි.

1. පුහුණු මොඩියුලයේ අන්තර්ගතය.

| විෂය ක්ෂේත්‍රය / අරමුණු | ක්‍රමවේදය |
|---|---|
| තරුණ අයිතිවාසිකම්, කම්කරු අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳ හැඳින්වීම. | සහභාගිකයන් කණ්ඩායම් 4 කට බෙදා පෙර සූදානම් කරනු ලැබූ නිර්වචනයන් ලබා දෙනු ලැබේ. එම නිර්වචනයන් ආශ්‍රයෙන් විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම් 4 ක් සංවිධානය කරන්න. අනතුරුව සියළු දෙනා එකඟවන කරුණු කෙරෙහි අවධානය යොමුකරමින් පුහුණුකරුගේ නිර්දේශයන් මේ සමඟ බෙදාගන්න. |
| පවතින නීතිරාමුව පිළිබඳව දැනුවත් වීම. | ජාතික තරුණ ප්‍රතිපත්තිය, තරුණ අසහනය පිළිබඳ ජනාධිපති කොමිෂන් වාර්ථාව හා ළමා ප්‍රඥප්තිය ආශ්‍රයෙන් කණ්ඩායම් සාකච්ඡාවක් කරන්න. |
| පුරවැසි නිරතවීම හෝ ක්‍රියාකාරකම් පිළිබඳ දැණුවත් වීම. | තරුණ ප්‍රජාවගේ පුරවැසි නිරතවීම වඩාත් පැහැදිලි දෘෂ්ටිකෝණයකින් දැකීම සඳහා සහභාගිකයින් සමඟ බුද්ධිකලම්බනයන් මඟින් තරුණ ප්‍රජාවේ පුරවැසි නිරතවීම පිළිබඳ හා එහිදී ඔවුන් මුහුණ දෙන ගැටලු, බාධක හඳුනාගත හැකිය. නාට්‍යානුසාරී ක්‍රියාකාරකම් මඟින් ඔම්බුඩ්ස්මන්වරයකුගේ හෝ බලපෑම් කණ්ඩායම් වල වැදගත්කම ඔවුන්ට ඒත්තුගැන්විය හැක. මේ සඳහා,<br>1. භූමිකා රංගන දෙකක් ඉදිරිපත් කරන්න.<br>2. මෙම භූමිකා රංගන විනිශ්චය සඳහා වෙනමම කණ්ඩායමක් පත් කරන්න.<br>3. එම කණ්ඩායමේ විග්‍රහයන් මත පුරවැසි නිරතවීම පිළිබඳව දැණුවත්භාවය වර්ධනය කරන්න.<br>4. මෙම කරුණු ලේඛන ගත කර සහභාගිකයන්ගේ ප්‍රයෝජනය සඳහා ලබා දෙන්න. |
| පාලනයට තරුණ ප්‍රජාව සහභාගිකර ගැනීමේදී මතුවන අභියෝග. | මේ සම්බන්ධව යොවුන් පාර්ලිමේන්තුව ආශ්‍රයෙන් සහභාගිත්ව කේන්ද්‍රීය සාකච්ඡාවක් හා යොවුන් පාර්ලිමේන්තු මන්ත්‍රීන්ගේ අත්දැකීම් බෙදාහදා ගැනීමට අවස්තාව ලබා දෙන්න. |
| වඩාත් යහපත් වූ පුරවැසි හා දේශපාලන සහභාගිත්වයක් සඳහා තරුණ ප්‍රජාව දිරිමත් කිරීම හා බලගැන්වීම. | සහභාගිකයින්ගේ අදහස් බුද්ධිකලම්භනයක් තුළින් ගොඩනගන්න. ඒ අනුව ඉදිරිපත් වූ තොරතුරු මනා ලෙස විශ්ලේෂනය කර තරුණ ප්‍රජාව දැණුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කරන්න. |

- තරුණ අයිතිවාසිකම්

තරුණ අයිතිවාසිකම් යනු තරුණ ප්‍රජාවගේ සිවිල් අයිතිවාසිකම් වැඩිදියුණු කිරීම සඳහා සැකසී ඇති මූලධර්ම මාලාවයි.මේ අනුව තරුණ අයිතිවාසිකම් සංවිධාන මූලිකවම කරනුයේ තරුණ ප්‍රජාවට සමාන අයිතිවාසිකම් ලබාදීම මඟින් සමාජය තුළ ඔවුන්ගේ භූමිකාව වැඩි දියුණු කිරීමයි. සියළු ජන කොටස්වල සහභාගීත්වය තහවුරු කෙරෙන සංවර්ධන ප්‍රවේශයන් හඳුන්වාදීම මෙමඟින් අදහස් කෙරේ.
ශ්‍රී ලංකාවේ අවුරුදු 15 ත් 29 ත් අතර වයස් කාණ්ඩය "තරුණයන් "ලෙස සලකනු ලබයි.එක්සත් ජාතීන්ට අනුව වයස අවුරුදු 15 ත් 24 ත් අතර වයස් කාණ්ඩය තරුණ ප්‍රජාව ලෙස සැලකේ. තරුණයා නිර්වචනය කිරීමේදී ඒ සඳහා බලපානු ලබන සාධක වෙනස් විය හැකිය. රටක පවතින සංවර්ධන මිණුම් අනුව මේ පිළිබඳව නිර්වචනයන් ඉදිරිපත් කර ඇත. ගෝලීය වශයෙන් තරුණයා, නවයෞවනයා, ළමයා හා වැඩිහිටියා පිළිබඳ නිර්වචනයන් වෙන් වෙන් වශයෙන් ලබා දුන්නද මෙම ඛාණ්ඩ සියල්ල අඛණ්ඩ අන්තර් වෙනස්වීම්වලට භාජනය වන්නවුන්ය. එහෙත් එකිකෙනාට වෙනස්වන ලක්ෂණයන්ගෙන් සමන්විතය. තරුණයා යනු ළමාවිය හා වැඩිහිටිවිය අතර කාලපරාශය ලෙස හැඳින්විය හැකි වුවද තරුණයා පිළිබඳ නිර්වචනයන් ඔවුන්ගේ මානසික හා ආකල්පමය පසුබිම මත ගොඩනැඟුනකි.
මේ අනුව තරුණයාගේ මූලික අයිතීන් ආරක්ෂාවන හා සියලු පාර්ශවයන්ගේ සහභාගීත්වය තහවුරු කෙරෙන තරුණ කේන්ද්‍රීය සංවර්ධන ප්‍රවේශයන් භාවිතා කිරීමත් ප්‍රජාතන්ත්‍රවාදිව තීන්දු තීරණ ගැනිම සඳහා ඉඩප්‍රස්ථා පුළුල් කිරිමත් සංස්කෘතික, ආර්ථික, දේශපාලනමය හා සමාජීය වශයෙන් බලගැන්වීමත් ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා වන ජීවන තත්වයක් උදාකිරිමත් මෙමඟින් අපේක්ෂා කෙරේ.

- කම්කරු අයිතිවාසිකම්.

ශ්‍රී ලංකාවේ කම්කරු නීතියට අනුව රැකියාවක නිරත වීම සඳහා අවම වයස වනුයේ වයස අවුරුදු 18 කි. (එහෙත් වයස අවුරුදු 14 සිට 18 දක්වාද සේවයේ යෙදිය හැකිය. මෙහිදි වයස අවුරුදු 18 ට වැඩි පුරවැසියන්ගෙන් මෙන් නොව සේවකයාගේ වයස සලකා කල හැකි සේවාවන් වල පමණක් නිරත කල යුතුය). තරුණයකු යම්කිසි රැකියාවක / වෘත්තියක නිරත වන්නේ නම් ඒ සඳහා ඔහුටද වෙනත් වැඩිහිටියකු විසින් උපයන වැටුප් මුදලම ලැබිය යුතුය.
යම්කිසි තරුණයෙක් අනාරක්ෂිත ස්ථානයක සේවය කරන්නේ නම් එහිදී ඔහුගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා සියළුම ක්‍රියාමාර්ග ගත යුතුය.
පහත දැක්වෙන්නේ තරුණයින් සඳහා නිර්දේශ කරනු ලබන අයිතිවාසිකම් කිහිපයකි.
(තරුණ ප්‍රඥප්තිය විසින් ලබා දී ඇති නිර්දේශ හා නිර්වචනයන් භාවිත කරන්න)

- වැඩකිරීමේ /සේවය කිරීමේ අයිතිය හෝ තීන්දු තිරණ ගැනිමේදි ඒ සඳහා සහභාගි විමේ අයිතිය.
- ජීවත්වීමේ හා නිසිලෙස සංවර්ධනය වීමේ අයිතිය.
- අධ්‍යාපනය ලැබීමේ අයිතිය.
- රැකියාවක නිරත වීමේ අයිතිය.
- සාමකාමීව විරෝධය පෑමේ අයිතිය.
- නොමිලේ සෞඛ්‍ය පහසුකම් ලැබීමේ අයිතිය.
- මූලික අවශ්‍යතා (ආහාර,නිවාස) සපුරා ගැනීමේ අයිතිය.

(මීට අමතරව එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය මඟින් විශ්ව ව්‍යාප්ත මට්ටමින් සෑම ළමයෙකුම භුක්තිවිඳිය යුතු අයිතිවාසිකම් දක්වා ඇති අතර එම අයිතිවාසිකම් තහවුරු කිරීම සෑම වැඩිහිටියෙකුගේම හා රාජ්‍යයන්ගේ වගකීමකි. ළමා ප්‍රඥප්තිය සඳහා ලංකා රජය අත්සන් කර 1991 දි ස්ථිර කරන ලදි. වයස 15 ට වැඩි තරුණ පිරිස් සඳහා අදාළ වන වගන්ති ඒ අයුරින්ම තරුණ පිරිසටද අදාළය.)

## <u>තරුණයන් වෙත පැවරෙන වගකීම්</u>

මීට අමතරව සමාජයක් වශයෙන් අපට තරුණ ප්‍රජාවගෙන් වගකීම් රැසක් බලාපොරොත්තු විය හැකිය.

- ❖ ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණයන්හි සහභාගී වීම - වර්තමානයේ පෙනී යන්නේ තරුණ තරුණියන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය හිමිව ඇතත් ඒ සඳහා ඔවුන් වැඩි උනන්දුවක් නොදක්වන බවයි.මෙමඟින් ඔවුන් තමාගේ දේශපාලන අදහස් ප්‍රකාශ කිරීමට ඇති ඉඩකඩ නොසලකා හරී.

- ❖ තරුණ පුද්ගලයකු ලෙස තමාගේ දෙමාපියන් හා වැඩිහිටියන්ට ගරුත්වයෙන් සැලකිය යුතු අතර පොදු හා පෞද්ගලික දේපලට හානිවන කටයුතු වලින් වැලකිය යුතුය.

- ❖ රජය මඟින් නොමිලේ ලබා දෙන නිදහස් අධ්‍යාපන පහසුකම් හා වෘත්තීය පුහුණු පාඨමාලා උපයෝගී කරගෙන තම ආයතනයට හා රටට සේවය කිරිම සඳහා කුසලතාවයන්ගෙන් හෙබි පුරවැසියෙක් ලෙස කටයුතු කිරිම.
- ❖ පවතින නීතිරාමුව පිළිබඳව දැනුවත් වීම.

වර්තමානයේදී දැකිය හැකි කරුණක් වන්නේ රටේ පවතින නීතිය පිළිබඳව තරුණයින් තුළ නිසි අවබෝධයක් නොමැතිකමයි. පවතින නීතිමය තත්වයන් හා නීතිමය වපසරිය පිළිබඳව දැනුවත් කිරිම ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ වගකිමක් වන අතර ශ්‍රී ලංකාවේ තරුණයාගේ යහපැවැත්ම සඳහා සාධනිය නිර්දේශයන් ඉදිරිපත් කරනු ලබයි.

- ❖ **2014** - තරුණ ප්‍රතිපත්තිය හා එහි නිර්දේශයන්,
- ❖ **1988** තරුණ අසහනය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා නිර්දේශයන්,
- ❖ ළමා අයිතීන් පිළිබඳ එක්සත්ජාතීන්ගේ ප්‍රඥප්තිය ,

  මෙම ප්‍රකාශයන් පරිශිලනය කිරිමෙන් පවතින නීතිරාමුව පිළිබඳව අවබෝධය ලබාගැනිමට කටයුතු කරන්න.

❖ පුරවැසි සහභාගීත්වය.

පොදු ගැටළු හඳුනාගැනීම සහ නිරාකරණය සඳහා පුද්ගල වශයෙන් හා කණ්ඩායම් වශයෙන් සහභාගි වීම හා ගන්නා පියවරවල් පිළිබඳ පුරවැසි නිරතවීම වශයෙන් නිර්වචනය කල හැක. තවද එය පුරවැසියන් සියළුදෙනාගේ සහභාගිත්වයෙන් පවතිනා සමාජයේ වෙනසක් /වැඩිදියුණුවක් ඇතිකිරීමක් ලෙසද හැදින්විය හැක.

මෙහිදී ප්‍රජාවගේ සහභාගිත්වය දේශපාලනික හෝ දේශපාලනික නොවන අරමුණක් මුදුන්පත් කරගැනීමට විය හැක. පුරවැසි නිරතවීම යනු ඉතා පුළුල් පරාසයක් කරා දිවයන සංකල්පයක් වන නිසා මෙහිදී තරුණ ප්‍රජාවගේ පුරවැසි නිරත වීම පිළිබඳ පමණක් සාකච්ඡා කෙරේ.

මනා ලෙස පුරවැසි නිරතවීමේ කටයුත්තට සහභාගී වීම සඳහා තරුණ පුද්ගලයින්ට පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කල හැක.

1. තරුණ අයිතිවාසිකම් සහතික කිරීම සඳහා කැපවන දේශපාලඥයින් /දේශපාලන ප්‍රතිපත්ති සඳහා තම ඡන්දය ලබාදීම.
2. තරුණ ප්‍රජාව මුහුණපාන ගැටළු නිරාකරණය කරගැනීම සඳහා බලපෑම් කණ්ඩායම් හෝ ඔම්බුඩ්ස්මන්වරයකු පත්කර ගැනීම සුදුසුය. උදාහරණයක් වශයෙන් අධ්‍යාපනය සම්බන්ධ ගැටළු ඉදිරිපත් කිරීමට එක් ඔම්බුඩ්ස්මන්වරයකු ද විරැකියාව ආදී ගැටළු ඉදිරිපත් කිරීමට තව ඔම්බුඩ්ස්මන්වරයකු ද පත්කරගත හැක.
**(ශ්‍රී ලංකා ජාතික තරුණ ප්‍රතිපත්තිය - පිටුව 21, ප්‍රතිපත්තිමය මැදිහත්වීම් i – vii)**

## (A) පාලනයට තරුණ ප්‍රජාව සහභාගිකරගැනීමේදී මතුවන අභියෝග.

මෙහිදී ප්‍රධානතම ගැටළුව වනුයේ තරුණ පරම්පරාව ක්‍රියාකාරී ලෙස දේශපාලන රාමුව තුල නිරත නොවීමයි. තවද දේශපාලන පද්ධතිය පිළිබඳ විධිමත් දැනුමක් සතු නොවීමද ගැටළුවකි. සාමාන්‍යයෙන් වයස අවුරුදු 35 ට අඩු පුද්ගලයින් දේශපාලන ක්ෂේත්‍රය තුල හා රජයේ තනතුරු වල නිරත වීමද ඉතා අඩු ප්‍රතිශතයක පවතී. මේ තත්වය අවම කරගැනීම සඳහා ගතහැකි එක් ක්‍රියාමාර්ගයක් වනුයේ පළාත් පාලන ආයතනයන්හි මැතිවරණවලදී යම්කිසි ආසන ප්‍රමාණයක් තරුණ ප්‍රජාව වෙනුවෙන් වෙන්කිරීමයි.

**(B)** අප හඳුනාගත් තවත් එක් අභියෝගයක් වනුයේ තරුණ ප්‍රජාවගේ දේශපාලන දැනුම හා අත්දැකීම් මදභාවයයි. මේ සඳහා ගතහැකි පියවරක් වනුයේ යොවුන් පාර්ලිමේන්තු සංකල්පයට ඔවුන් සමීප කිරීමයි.මේ මඟින් තරුණ ප්‍රජාවට රටේ පවතින දේශපාලන පද්ධතිය පිළිබඳ අවබෝධයක් ලබාදිය හැක.තවද යොවුන් පාර්ලිමේන්තු සභිකයන්හට අනෙක් යොවුන් ප්‍රජාව දේශපාලනමය වශයෙන් දැනුවත් කිරීම සිදුකල හැක.

තරුණ තරුණියන් විසින් මුහුණපාන තවත් ගැටළුවක් වන්නේ **Facebook** වැනි විවිධ සමාජ වෙබ් අඩවි මඟින් නොමඟ යවන තොරතුරු හා පණිවුඩ හුවමාරු වීමයි. මෙම තත්වය දුරු කිරීම සඳහා ගතහැකි පියවරක් වනුයේ **Facebook** හි නිරන්තරයෙන් නිවැරදි තොරතුරු සපයන යාවත්කාලීන කතිකාවතක් ගොඩනැගීමයි.

**(C)** වඩාත් යහපත් වූ පුරවැසි හා දේශපාලන සහභාගිත්වයක් සඳහා තරුණ ප්‍රජාව දිරිමත් කිරීම හා බලගැන්වීම.

- තරුණ පරම්පරාවට දේශපාලනයේ නියැලීමට ඇති බාධක ඉවත් කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින් හා දේශපාගඥයින් උනන්දු කරවීම.
- තරුණ ප්‍රජාව අතර වැදගත් දේශපාලන කරුණු අඩංගු අත්පත්‍රිකා ආදිය බෙදාහැරීම.
- පාසල් ගුරුවරුන් හා පාසල් දරුවන්හට සමකාලීන දේශපාලන හා සමාජ ගැටළු පිළිබඳ විවාද පැවැත්වීමට හා තම අදහස් ප්‍රකාශ කිරීමට ඉඩප්‍රස්ථා සැලසීම.
- දේශපාලන භූමිකා රංගන හා කෙටි නාට්‍ය සඳහා පාසල් දරුවන්ව හා තරුණ ප්‍රජාව යොමු කිරිම.

<u>සැසි සැලැස්ම</u>

| විෂය ක්ෂේත්‍රය | Youth right civic engagement and Political participation | ස්ථානය | |
|---|---|---|---|
| කාලය/ | | ඉලක්ක කණ්ඩායම හා ප්‍රමාණය | |

| අඅ | කාලය | උප විෂය කේෂත්‍රයන් | ක්‍රමවේදය | උපකාරක |
|---|---|---|---|---|
| 01. | පැය 1. 1/2 | 1. තරුණ අයිතිවාසිකම්.<br>2. කම්කරු අයිත්වාසිකම්. | Power point ඉදිරිපත් කිරීම.<br>කණ්ඩායම් වැඩමුළු.<br>Reference - කම්කරු නීති රීති. | Laptop ,Multimedia Projector, ශාලා පහසුකම්,පුහුණු ද්‍රව්‍ය,පහසුකාරකයින්. |
| 02. | පැය 01 | 1. තරුණ වගකීම්.<br>Youth responsibility | Power point ඉදිරිපත් කිරීම.<br>වැඩමුළු<br>(බුද්ධිකලම්බනය /කණ්ඩායම් සාකච්ඡා) | Laptop,Multimedia Projector, ශාලා පහසුකම් ,පුහුණු ද්‍රව්‍ය,පහසුකාරකයින්. |
| 03. | පැය 1. 1/2 | 1. දැනට පවතින නීතිමය රාමුව පිළිබඳ දැනුවත් කිරීම.<br>(Awareness of the existing legal framework) | කණ්ඩායම් සාකච්ඡා.<br>P/P<br>Reference Youth Rights Unicef/Uno | Laptop ,Multimedia Projector, ශාලා පහසුකම්,පුහුණු ද්‍රව්‍ය පහසුකාරකයින්. |
| 04. | පැය 03 | 1. සිවිල් සමාජ ක්‍රියාකාරකම් වල නිරත වීම.<br>Civic engagement | භූමිකා රංගන,<br>කණ්ඩායම් සාකච්ඡා, සිද්ධි අධ්‍යයන,වීඩියෝ | Laptop,Multimedia Projector, ශාලා පහසුකම්, පුහුණු ද්‍රව්‍ය, පහසුකාරකයින්. |
| 05. | දින 01 | 1. පාලන කටයුතු හා දේශපාලනයේ නියලීමට තරුණයන්ට ඇති අභියෝග. | යොවුන් පාර්ලිමේන්තුව නිරීක්ෂණය,<br>වීඩියෝ දර්ශන,<br>Fb – Flatform. | Laptop ,Multimedia Projector,<br>පුහුණු ද්‍රව්‍ය,<br>අන්තර්ජාල පහසුකම්,<br>ප්‍රවාහනය. |
| 06. | පැය 06 | 1. පුළුල් සමාජ ක්‍රියාකාරකම් හා දේශපාලන කටයුතු වල නියලීමට තරුණයින් උනන්දු කරවීම හා සවිබල ගැන්වීම. | අත්පත්‍රිකා,<br>විවාද,<br>භූමිකා රංගන,<br>කෙටි නාට්‍ය, | අත්පත්‍රිකා,<br>මැදිහත්කරුවන්,<br>පුහුණු ද්‍රව්‍ය, |

පහසුකාරක : ..........................................................................

සහය පහසුකාරක :......................................................................